## 400 උදයෙ පිපුණු

උදයෙ පිපුණු නෙලුම් මලක ඔබව පෙනෙනවා
සුවඳ සමන් පිච්ච වැලක ඔබව පෙනෙනවා
දිලෙන සුපුන් සඳ විලසින් ඔබව පෙනෙනවා
සුර රැජිණියෙ සුර රැජිණියෙ ඔබව පෙනෙනවා

නිල් ගුවනේ තුරුවැල් මැද ඔබව මැවෙනවා
ඈත ඇදෙන පවන් පොදක ඔබව මැවෙනවා
සවන ගැටෙන ගීත වැලක ඔබව මැවෙනවා
සුර රැජිණියෙ සුර රැජිණියෙ ඔබව මැවෙනවා

නෙත’ග රැඳුණු ඔබේ බැල්ම අපේ ජීවයයි
හදෙහි රැඳුණු ඔබෙ සෙනෙහස අපේ ජීවයයි
මුව’ග ලෙලෙන අදර කැල්ම අපේ ජීවයයි
සුර රැජිණියෙ සුර රැජිණියෙ අපේ ජීවයයි

හදෙහි බැඳුණු පව් දුරුකර දෙන්න මැණියේ
ගතෙහි දුබල බව පහකර දෙන්න මැණියේ
ජේසු පුතුට අප ළංකර දෙන්න මැණියේ
සුර රැජිණියෙ අප ළංකර දෙන්න මැණියේ